# මලී සහ පුංචි බලු පැටියා



වෙනුලි තෙහාරා නිම්තකි

# මලී සහ පුංචි බලු පැටියා

වෙනුලී තෙහාරා නිර්මිතකි

# පිදුම

ආදරණීය විදුහල්පතිතුමියටත්,

අකුරු කියාදෙන පන්තිභාර ගුරුතුමියටත්,

පොත් ලිවීම සඳහා උපදෙස් ලබාදුන් සියලුම ගුරු දෙමාපියන්ටත්,

මාගේ දෙමාපියන්ටත්,

මෙම පොත පුද කරමි.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.
මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිණිය,
මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

එකෝමත් එක කාලෙක මලී කියලා පුංචි ගැහැණු ළමයෙක් හිටියා. එයා හරිම ලස්සනයි. ඒ වගේම කරුණාවන්තයි.



දවසක් ඒ පුංචි මලී යාළුවනුත් එක්ක සෙල්ලම් කර කර හිටියා.



එකපාරටම මලී පුංචි අසරණ බලු පැටියෙක් ඉන්නවා දැක්කා. පුංචි මලීට හරියට දුක හිතුණා.



පුංචි මලීට ඉවසගන්න බැරුව ඉක්මණට බලු පැටියා ගාවට ගිහින් බලු පැටියා වඩා ගත්තා.



මලී බලු පැටියාව ගෙදර අරන් ගියා. ඇය ඉතින් සතුන් කාටත් ආදරෙයිනේ, ඒ නිසාම බලු පැටියාව නාවලා පිහදාලා ඔක්කොම වැඩ ටික අවසන් කළා.



ඔන්න ඉතින් බලු පැටියායි, මලීයි හොඳ යාළුවෝ වුණා. මලී බලු පැටියාට කෑම හදලා දුන්නා.



දවසක් එයා සෙල්ලම් කරලා ගෙදර එද්දී එයාගේ පුංචි බලු පැටියා හිටියේ නැහැ. මලී එයාව හැමතැනම හෙවුවා. ඒත් වැඩක් වුණේ නැහැ. පහුවදාත් මලී බලු පැටියාව හැමතැනම හෙවුවා ඒත් වැඩක් වුණේ නෑ.



මලී පාරේ අඬමින් යද්දී එයා දැක්කා එයාගෙ හොඳම යාළුවාව. එයා පුංචි බලු පැටියත් එක්ක තමයි සෙල්ලම් කර කර හිටියේ. මලී ඉකමනට එයාගෙ යාළුවා ගාවට ගිහිල්ලා මෙහෙම ඇහුවා. ඇයි ඔයා මගේ බලු පැටියාව හොරකම් කරේ.



මේ ඇත්තටම මගේ බලු පැටියා, ඔයාට බොහොම ස්තූතියි මගේ බලු පැටියා බලා ගත්තට කියලා යාළුවා කිවුවා. එතකොට මලී පුදුම වුණා. මලීගේ යාළුවා තව දෙයක් කිවුවා. මම ඔයාගේ යාළුවෙක් වෙලා හිටියට මම සුරංගනාවියක්.



ඔයා ඇත්තටම හොඳ ළමයෙක් මම ඔයාට විශේෂ තෑග්ගක් දෙන්න තීරණය කරා. මම ඔයාට මගේ බලු පැටියාව තියා ගන්න දෙනවා. ඔය දෙන්නා ඉතින් සතුටින් කාලය ගත කරන්න. මම එහෙනම් යනවා.



## පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී.

ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

ISBN: 978-6-242 0-669-2

9 786242 066929